**CATHOLIC BISHOPS' CONFERENCE IN SRI LANKA**

Lankarama, 19, Balcombe Place, Colombo - 08, Sri Lanka.

Tel. No : 0094-11- 2697062 / 2697110
Fax.No : 0094-11- 2699619
E-mail : EpiscopalSL@gmail.com


# ශ්‍රී ලංකා කතෝලික රදගුරු සමුළුවේ පාස්කු පණිවුඩය 2025

පාස්කුව කිතුනු ඇදහිල්ලේ හදවත වන අතර, කිතුනු දින දර්ශනයේ වඩාත්ම උත්සවාකාරයෙන් සමරනු ලබන වාර්ෂික මංගල්‍යයයි. පාස්කු මංගල්‍යයේ දී අපි උත්ථාන වූ සමිඳාණන් ද, අපගේ ගැලවුම්කරුවාණන් ද වන, නාසරතයේ ජේසුන් වහන්සේ, පාපය සහ මරණය පරදා ලද විජයග්‍රහණය ප්‍රකාශ කරමින් සමරන්නෙමු. "ජේසුස් වහන්සේ උත්ථාන වූ සේක" (ලූක් 24:5) යන සුරදූත හඬ අප දෙසවනේ දෝංකාර දීමට අපි ඉඩහරිමු. අප ජේසුන් වහන්සේට ඇති සම්පතාවය ගැඹුරු කර ගැනීමට සහ සැම කලක දී ම, විශේෂයෙන් ම, අප ජීවිතයේ පරීක්ෂාවන් සහ අභියෝග අත්විඳින අවස්ථාවල දී, උත්ථාන වූ ස්වාමින් වහන්සේ අප මධ්‍යයේ වැඩ සිටින බවට වන හැඟීම තුළ අලුත් වීමට ප්‍රීතිමත් පාස්කු සමය අපට ඇරියුම් කරයි.

මේ 2025 වන වසරේ අප ජේසුස් ක්‍රිස්තුස් සමිඳාණන් වහන්සේගේ ජුබිලි වසර සමරද්දී ක්‍රිස්තුන් වහන්සේගේ බලාපොරොත්තුව, අපව ඉච්ඡාභංගත්වයට පත් නොකරන බලාපොරොත්තුව, වැළඳ ගැනීමට සහ ඒ තුළ අලුත් වීමට, අපගේ විශ්ව එඬේරාණන් වන ෆ්‍රැන්සිස් ශුද්ධෝත්තම පියතුමාණෝ අපෙන් ඉල්ලා සිටිති. මෙම බලාපොරොත්තුව වෙත ඇදී යාමට සහ එය සොයා යන සෑම දෙනා අතර අපගේ සාක්ෂි දැරීම මගින් එය පතුරුවා හැරීමටත්, ෆ්‍රැන්සිස් ශුද්ධෝත්තම පියතුමාණෝ අපට ඇරියුම් කරති. (Spes Non Confunit No. 25 )

උත්ථාන වූ සමිඳාණන් වමහන්සේ උන්වහන්සේගේ ශ්‍රාවකයින්ට දර්ශනය වී සාමයේ තිළිණය ඔවුන්ට දානය කළ සේක. එම සාමයේ තිළිණය ම අපගේ දයාබර මාතෘ භූමිය වෙත ද සමස්ත ලෝකය වෙත ද අපි අයැද සිටිමු. සමහර රටවල, විශේෂයෙන් මැද පෙරදිග කලාපයේ සහ යුක්රේනයේ, ඝාතනයට ලක්වන සහ තුවාල ලබන අපගේ සහෝදර සහෝදරියන් වෙත අපගේ මනස සහ හදවත් යොමුවී තිබේ. යුද්ධයෙන් විනාශ වූ මෙම ප්‍රදේශවල, සාමකාමී සහ සාධාරණ සාමයක් නැවත ඇති කිරීම සඳහා අපි උත්ථාන වූ සමිඳාණන් වහන්සේගේ ආශිර්වාදය අයැද සිටිමු.

මිනිස් ජීවිතයේ පාරිශුද්ධභාවය නව ජවයකින් ප්‍රවර්ධනය කිරීමට පාස්කුව අපට ඇරියුම් කරයි. මේ අනුව, ප්‍රජනනයට බාධා කිරීම, ගබ්සා කිරීම සහ වෙනත් ආකාරයේ ඝාතනයන් සහ මිනිස් ජීවිතය විනාශ කිරීම වැනි, මිනිස් ජීවිතය ප්‍රවර්ධනය කිරීමට අහිතකර වන සියල්ල හෙළා දැකීමට අප කැඳවනු ලැබේ.

2019 දී කතෝලික සහ අනෙකුත් ක්‍රිස්තියානි දේවස්ථානවල අහිංසක බැතිමතුන් ද වෙනත් ස්ථානවල සිටි මිනිසුන් ද ඉලක්ක කර ගනිමින්, සිය ගණනක් මිනිසුන් ඝාතනයට ලක් කරමින් සහ තුවාල සිදු කරමින්, එල්ල කරන ලද පාස්කු ඉරිදා බෝම්බ ප්‍රහාරයේ හයවන සංවත්සරය ද මෙම පාස්කු ඉරුදින සනිටුහන් කෙරේ. මෙම ම්ලේච්ඡ ප්‍රහාරය පිළිබඳ ස්වාධීන සහ අපක්ෂපාතී විමර්ශනයක් සහතික කිරීම සඳහා වත්මන් රජය විසින් යම් යම් ධනාත්මක පියවර ගෙන ඇති බව අපි නිරීක්ෂණය කරමු. මේ දක්වා ගෙන ඇති උත්සාහයන් අපි අගය කරන අතරම, කඩිනම් සහ යුක්තිය පිළිබඳ කාරණයක් ලෙස විමර්ශනවල අවසාන ඉලක්කය විය යුත්තේ අපරාධකරුවන් කවුරුන් ද යන්න සහ මෙම ම්ලේච්ඡ ක්‍රියාවට ආධාර අනුබල දුන්නවුන් කවුරුන් ද යන්න තහවුරු කර ගැනීම බව ද අපි අවධාරණය කර සිටිමු. අප රට නායකයින්ට ප්‍රඥාව සහ ධෛර්යය මෙන් ම වින්දිතයින්ට සැනසීම සහ සුවය ලබා දෙන ලෙස අපි දිගින් දිගටම යාච්ඤා කරමු.

ජේසුන් වහන්සේ නම් වූ සුන්දර තිළිණය වෙනුවෙන් අපි දෙවියන් වහන්සේට ස්තූති කරන අතරම, අපගේ ජීවිතය තුළ දී උත්ථාන වූ සමිඳාණන් වහන්සේගේ ජීවමාන සාක්ෂිකරුවන් වීමට, ශුද්ධාත්මයාණන් වහන්සේ විසින් අප සියල්ලන් ම නවතාවයකට පත් කරනු ලබන පිණිස අපි යාච්ඤා කරමු.

අපගේ සියලු ඇදහිලිවන්තයින්ට සහ අප පාඨකයින්ට උත්ථාන වූ සමිඳාණන් වහන්සේගේ ප්‍රීතිය සහ සාමය ප්‍රාර්ථනා කරමු.

**✠ අති උතුම් හැරල්ඩ් ඇන්තනි හිමිපාණෝ**
සභාපති
ශ්‍රී ලංකා කතෝලික රදගුරු සමුළුව

**✠ අති උතුම් ජේ. ඩී. ඇන්තනි ජයකොඩි හිමිපාණෝ**
මහා ලේකම්
ශ්‍රී ලංකා කතෝලික රදගුරු සමුළුව